සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 09 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකයː

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ බයිබලයේ ප්‍රඥා සාහිත්‍ය ග්‍රන්ථයකි.

    1. සිරාක්
    2. විලාප ගී
    3. නෙහෙමියා
    4. ජෝවෙල්

02. නව ගිවිසුමේ ප්‍රථමයෙන් රචිත ශුභාරංචි ග්‍රන්ථය වන්නේ;

    1. මතෙව්
    2. මාක්
    3. ලූක්
    4. ජොහාන්

03. ''සියොන්'' යනුවෙන් හැඳින්වෙන්නේ;

    1. ජේරුසලමය.
    2. නිනිවයය.
    3. නාසරතය
    4. ගලීලයය.

04. සදාතන ජීවිතය ලබාදෙන සැබෑ ආහාරය .....................................යි.
    හිස්තැනට සුදුසු වචනය;

    1. මිදිරසය
    2. පූපය
    3. දිව්‍ය සත්ප්‍රසාදය
    4. ශුධාත්මය

05. හොඳ නරක අවබෝධ කිරීමේ ගසින් කෑමෙන් මිනිසාට උරුම වූයේ;

    1. සදාතන ජීවිතයයි.
    2. මරණයයි.
    3. දඬුවමයි.
    4. ඒදන් උයනයි.

06. දෙවියන් වහන්සේ, අකීකරු වූ .............................. ට, අනුකම්පා කර <u>විමුක්තියේ පොරොන්දුවක්</u> දුන් සේක.
    මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර වන්නේ;

    1. ආදම් සහ ඒව
    2. බාරක් හා දෙබෝරා
    3. අනනියස් හා සපිරා
    4. කායින් සහ ආබෙල්

07. සහෝදර ප්‍රේමයට පිටුපා යමින් ඊර්ෂ්‍යාව නිසා තම සහෝදරයා මරා දමනු ලැබුවේ;

    1. කායින් විසිනි.
    2. ආබෙල් විසිනි.
    3. ජාකොබ් විසිනි.
    4. ජුදා විසිනි.

08. ශුද්ධ බයිබලයේ සඳහන් පරිදි ජල ගැල්මට හේතුව වන්නේ, ලොව පුරා පැතිරී ඇති මනුෂ්‍යයාගේ;
1. පාපයයි. 2. ඊර්ෂ්‍යාවයි. 3. තණ්හාවයි. 4. ක්‍රෝධයයි.

09. දෙවියන් වහන්සේගේ විශේෂ සැලකිල්ලට යොමුව මිත්‍රත්වයේ දෑත නෝවා වෙත දිගු කරනු ලැබුවේ; නෝවාගේ,
1. දිළිඳුකම නිසාය. 2. ධර්මිෂ්ඨකම නිසාය. 3. දරුවන් නිසාය. 4. මහලු බව නිසාය.

10. වීර නායකයන් පත් කිරීම ගැන සඳහන් වන ශුද්ධ බයිබලීය ග්‍රන්ථය;
1. සාමුවෙල් ය. 2. ජෝෂුවා ය. 3. ගණන් කතාව ය. 4. වීරාවලිය ය.

11. ඊශ්‍රායෙල්වරුන් බොරු දෙවිවරුන්ට තනා තිබුණ සියලු පූජාසන විනාශ කර දමා යුද්ධයට යාමට සේනා රැස් කළේ;
1. බාරක් ය. 2. දෙබෝරා ය. 3. ජුදිත් ය. 4. ගිඩියොන් ය.

12. ඉශ්‍රායෙල් දේශය එක්සත් කොට ප්‍රබල රාජ්‍යයක් ගොඩ නැගීමේ පුරෝගාමියා වූයේ;
1. නාහාෂ් ය. 2. දෙබෝරා ය. 3. සාවුල් ය. 4. ආහාස් ය.

13. තමාට අප්‍රසන්න වූ යමෙක් කෙරෙහි ඇවිලෙන අධිකතර සිත් වේගය හඳුන්වනු ලබන්නේ;
1. උඩඟුව 2. රාගය 3. ඊර්ෂ්‍යාව 4. ක්‍රෝධය

14. ජන්මයේදීම ආදි මවුපියන්ගෙන් අප ලබන පාප දෝෂය වන්නේ;
1. කර්ම පාපයයි. 2. ජන්ම පාපයයි. 3. බරපතල පාපයයි. 4. සුළු පාපයයි.

15. ''මම නුඹලාගේ වැරදි වලාකුළක් මෙන්ද නුඹලාගේ පව් මීදුමක් මෙන්ද පහකර දැමුවෙමි'' යනුවෙන් සඳහන් වන දිවැසිවර ග්‍රන්ථය,
1. ජෙරමියා 2. මීකා 3. යෙසාය 4. දනියෙල්

16. දෙවියන් වහන්සේගේ ආදරය හා කරුණාව පෙන්වා දෙන උපමා කතාවකි.
1. පොහොසත් මෝඩයා 2. යහපත් සමාරියා 3. නැතිවූ පුත්‍රයා 4. තිරිඟු හා කිරිඳි

17. ''සිහිසන් ඇතිව අවදිව ඉන්න ඔබගේ විරුද්ධකාරයා වන යක්ෂයා ගොරවන සිංහයකු මෙන් ................................ ඔබ මොබ ඇවිදින්නේය.'' මෙසේ සඳහන් ශුද්ධ ලියවිලි පාඨය,
1. 2 පේදුරු 3;9 ය. 2. ලූක් 15;8 ය. 3. 1 කොරින්ති 5;2 ය. 4. 1 පේදුරු 3;8 ය.

18. ''ඔබ අතරෙන් යමෙක් රෝගීව සිටින්නේ නම් ඔහු සභා මූලිකයන් කැඳවා ගනීවා'' මෙහි සඳහන් සභා මූලිකයන්ගේ තැන වර්තමානයේ දරන්නේ,
1. කිතුනු ඒකක නායකයන්ය. 2. පූජාප්‍රසාදිතුමන්ලාය.
3. ගිහි ජනතාව ය. 4. කිතුනු දූත සේවා සභාව ය.

19. අපගේ ජීවිත ශුධාත්මයාණන් වහන්සේගේ මන්දිර වේ. එබැවින් අප ජීවිත .............................. ගත කළ යුතුය. මෙහි හිස්තැනට සුදුසු වචනය,
1. සාමයෙන් 2. ප්‍රේමයෙන් 3. ශුද්ධවන්තව 4. ප්‍රීතිමත්ව

20. A ළදරු ඝාතනයක් වේ. B මානව අයිතියක් වේ.
C අශික්ෂිත පාපයක් වේ. D වෛද්‍ය විද්‍යාවට අනුකූල වේ.
ඉහත මරණ අතරින් කතෝලික සභා ධර්මෝපදේශය අනුව ගබ්සාව පිළිබඳ නිවැරදි වරණය වන්නේ,
1. A හා B 2. B හා C
3. C හා D 4. A හා C

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01. i. ශුද්ධ බයිබලයේ අඩංගු එළිදරව්වාදී ග්‍රන්ථ දෙක නම් කරන්න.
    ii. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් ප්‍රධාන චරිත දෙක නම් කරන්න.
    iii. ගීතාවලියේ අඩංගු ගීත වර්ග දෙකක් සඳහන් කරන්න.
    iv. මතෙව් ශුභාරංචිය සඳහා භාවිතා වන වෙනත් නම් දෙකක් ලියන්න.
    v. සුබාරංචි ග්‍රන්ථවල සඳහන් ''මම වෙමි'' ප්‍රකාශ දෙකක් ලියන්න.
    vi. උත්පත්ති 3;15 ට අනුව ස්ත්‍රියගේ වංශය හා සර්පයාගේ වංශය ලෙස හඳුන්වනු ලබන පාර්ශව දෙක සඳහන් කරන්න.
    vii. සාමුවෙල් නම් ශ්‍රේෂ්ඨ පුද්ගලයා දැරූ තනතුරු දෙකක් සඳහන් කරන්න.
    viii. දවිත් දෙවියන් වහන්සේගේ නාමයෙන් ගොලියත් හා සටනට ඉදිරිපත්ව ඒ සඳහා රැගෙන ගිය ද්‍රව්‍ය දෙක නම් කරන්න.
    ix. ස්වර්ගයට මොර ගසන පාපයන් දෙකක් ලියන්න.
    x. පාපයට ලැබෙන දඬුවම් වර්ග දෙක නම් කරන්න.

02. i. නව ගිවිසුමේ ඇතුළත් ශුද්ධවර ලූක් තුමාගේ කෘති දෙක නම් කරන්න.
    ii. සමදර්ශක සුබාරංචි ග්‍රන්ථ තුන නම් කරන්න.
    iii. ''ඔබේ වචනය මාගේ දෙපයට පහනක්ය මාවතට එළියක්ය'' මෙම ප්‍රකාශය අර්ථවත් කිරීම සඳහා ඔබ ශුද්ධ ලියවිල්ල යොදා ගන්නා ආකාර පහක් ලියා දක්වන්න.

03. i. වර්තමාන සමාජයේ දක්නට ලැබෙන පාපී ක්‍රියා දෙකක් නම් කරන්න.
    ii. පාපයට වැටුණු මිනිසාට නියම වූ දඬුවම් තුනක් සඳහන් කරන්න.
    iii. පාපය ප්‍රතික්ෂේප කර දේව අභිමතයට ගරු කරමින් නිවැරදි දේ කිරීමට අවශ්‍ය වරම් පතා යැදුමක් ලියන්න. (යාච්ඤාවක අඩංගු විය යුතු පියවර අනුගමනය කරන්න.)

04. i. දෙවියන් වහන්සේ වීර නායකයන් තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.
    ii. ඊශ්‍රායෙල් රජවරුන් කළ සේවාවන් තුනක් සඳහන් කරන්න.
    iii. දෙවියන් වහන්සේ පත්කළ වීර නායකයන්ගේ ආදර්ශය අනුව, ප්‍රසාද ස්නාපනය ලැබූ ඔබ සැබෑ නායකයකු ලෙස කටයුතු කරන්නේ කෙසේදැයි කරුණු පහක් ඉදිරිපත් කරන්න.

05. i. ජේසුස් වහන්සේගෙන් පව් සමාව ලබාගත් පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.
    ii. මුල් අගුණ පාපයන් වෙනුවට දියුණු කරගත යුතු ධර්මගුණ තුනක් සඳහන් කරන්න.
    iii. ශුද්ධ වූ අගෝස්තීනු මුනිතුමන් ආදර්ශයට ගෙන සිත්හැරීම පිළිබඳව කරුණු පහක් ඉදිරිපත් කරන්න.

06. i. රෝගීන් ආලේපනයේදී ශුද්ධ තෛලයෙන් ආලේප කරනු ලබන රෝගියාගේ සිරුරේ ස්ථාන දෙක නම් කරන්න.
    ii. රෝගීන් ආලේපය ලැබීමට සුදුසුකම් ලබන කණ්ඩායම් තුනක් නම් කරන්න.
    iii. අසාධ්‍ය රෝගියෙකු වෙනුවෙන් කිතුනු දරුවෙකු ලෙස ඔබ කටයුතු කරන ආකාර පහක් යෝජනා කරන්න.

07. කෙටි සටහන් ලියන්න.
    i. නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමාව
    ii. නැතිවූ කාසිය පිළිබඳ උපමාව
    iii. සමගි සන්ධානය
    iv. රෝගීන් ආලේපනය

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 09 - 2023

# කතෝලික ධර්මය

## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. 1 | 06. 1 | 11. 4 | 16. 3 |
| 02. 2 | 07. 1 | 12. 3 | 17. 4 |
| 03. 1 | 08. 1 | 13. 4 | 18. 2 |
| 04. 3 | 09. 2 | 14. 2 | 19. 3 |
| 05. 2 | 10. 4 | 15. 3 | 20. 4 |

### II කොටස

01.
- i. දනියෙල්, එළිදරව්ව (පිටුව 4, 8)
- ii. පේදුරුතුමා, පාවුළුතුමා (පිටුව 7)
- iii. ප්‍රශංසා ගීතිකා, විලාප ගීතිකා, තුති දීමේ ගීතිකා, ප්‍රඥා ගීතිකා, රාජකීය ගීතිකා, වන්දනා ගීතිකා, විශ්වාසයේ ගීතිකා (පිටුව 11 - 13)
- iv. ශුද්ධ වූ සභාවේ ශුභාරංචිය, දේව රාජ්‍යයේ ශුභාරංචිය (පිටුව 16)
- v. ''ජීවනදායක භෝජනය මම වෙමි'' / ''ලෝකයේ ආලෝකය මම වෙමි.''/ ''බැටළුවන්ට දොරටුව මම වෙමි.'' / ''මම යහපත් එඬේරා වෙමි.''/ ''පුනර්ජීවනය ද ජීවනයද මම වෙමි.'' / ''සැබෑ මිදි වැල මම වෙමි.'' (පිටුව 16 - 20)
- vi. මානව වංශය/ සාතන් (යක්ෂයා) (පිටුව 24)
- vii. විනිශ්චයකාරයෙකි./ පූජකයෙකි/ දිවැසිවරයෙකි. (පිටුව 39)
- viii. ගල් පටියක් සහ මටසිලුටු ගල් කැට පහක්. (පිටුව 43)
- ix. මිනී මැරීම/ දුගීන්ට හිංසා කිරීම. / සේවකයින්ගේ වැටුප් වංචා කිරීම. (පිටුව 49)
- x. සදාකාලික දඬුවම/ කාලීන දඬුවම (පිටුව 57) (ල. 2x10 = 20)

02.
- i. ලූක් ශුභාරංචිය/ අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත (පිටුව 7, 15)
- ii. මාක් ශුභාරංචිය/ මතෙව් ශුභාරංචිය/ ලූක් ශුභාරංචිය (පිටුව 15)
- iii. දිනපතා ශුද්ධ ලියවිල්ල කියවීම, මෙනෙහි කිරීම, ඉරුදින දිව්‍ය පූජාවේදී දේව වචනයට සවන් දීම, ජීවිත අභියෝග හමුවේ දේව වචනයට ළංවීම, යාච්ඤා කිරීමේදී දේව වචනය යොදා ගැනීම/ ජීවිත සිද්ධීන් තුළ දේව වචනය තුළ පිළිතුරු සෙවීම/ දිරිමත් වීම.

(ල. 2+3+5 = 10)

03. i. මිනිස් ඝාතන/ පළිගැනීම/ ළමා අපචාර/ යුද්ධය/ සොරකම/ ගබ්සාව (පිටුව 31)
ii. පොළව සාප ලැබීම/ වනයේ පලා කෑම/ වෙහෙස මහන්සි වී ආහාර ලබා ගැනීම./ පොළවෙන් කටු පඳුරු හා වල් පැළෑටි බිහිවීම. (පිටුව 23)
iii. යාච්ඤාවක අඩංගු විය යුතු පියවර අනුගමනය කරමින් සිසුවා ලියා ඇති කරුණු අනුව ලකුණු ප්‍රදානය කරන්න.

04. i. බාහිර ආක්‍රමණවලින් හා බලපෑම් වලින් ඉශ්‍රායෙල් ජනයා මුදා ගැනීම/ ඔවුන්ගේ ජීවිත සාර්ථක කර ගැනීම/ ජනතාව එක්සත් කිරීම. (පිටුව 36)
ii. ජනතාව එක්සේසත් කිරීම/ දේව මාළිගය ගොඩනැගීම./ ජනතාව වෙනුවෙන් සටනට යාම/ රාජ්‍යය පාලනය කිරීම. (පිටුව 36 - 46)
iii. සැමවිට පොදු ජනයාගේ යහපත පිණිස කටයුතු කිරීම.
පාසල තුළ වගකීම් හරියාකාරව ඉටු කිරීම.
සිසුන් අතර ඇතිවන අඬදබර වැලැක්වීම.
සැමට එකසේ සැලකීම/ සාමය ආරක්ෂා කිරීම වැනි ශිෂ්‍යයන් ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

05. i. පව්කාර ස්ත්‍රිය/ ගල් ගසා මරන්නට නියම වූ ස්ත්‍රිය (පිටුව 53 - 54)
ii. බැහැපත්කම/ ත්‍යාගවන්තම/ බ්‍රහ්මචර්යාව/ ශාන්තිය/ මිත්‍යාචාරය/ ප්‍රේමය/ උද්යෝගය (පිටුව 49)
iii. මවගේ බලවත් යාච්ඤාවත්, ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමාගේ මඟ පෙන්වීමත් නිසා ඔහු තුළ ජීවිත වෙනසක් ඇතිවිය. පාපකාරී ජීවිතයක් අගෝස්තීනුතුමාගේ සිත් හැරීම වෙනුවෙන් යාච්ඤා කළේ මව වූ මොනිකා තුමියයි. අපද සිත් හැරීම සඳහා යාච්ඤා කළ යුතුය. සිත් හැරීමක් ඇති වූ විට පව් සමාව ලබා ගැනීම සඳහා පාපොච්චාරණය කළ යුතුය. එවිට දේව ආදරය අත්දකින්නට හැකිවේ. දූර් පරීක්ෂා ජයගත යුතුවේ.
(සිසුවා ලියා ඇති කරුණු සලකා ලකුණු ලබා දෙන්න.)

06. i. රෝගියාගේ නළල සහ දෑත (පිටුව 68)
ii. වයස්ගතවී හෝ රෝගී වී හෝ මරණාසන්න තත්වයේ සිටින අය
බරපතල සැත්කම් වලට සූදානම් කරන අය.
මරණාසන්න නොවූවත් ස්වල්ප කාලයකින් මිය යා හැකි අය. (පිටුව 62)
iii. රෝගයා බැහැදැකීම./ රෝගීන් ආලේපය සඳහා./ රෝගියා සූදානම් කිරීම./ රෝගියාගේ බිය පහකිරීම./ වෙහෙස නොබලා ඇප උපස්ථාන කිරීම./ රෝගියා වෙනුවෙන් යාච්ඤා කිරීම./ අවසන් ගමන යාමට පෙර දේව දරුකම තුළ රෝගීන් ආලේපය ලබා දීම සඳහා කටයුතු කිරීම. (පිටුව 73)

07. i. නැතිවූ පුත්‍රයා පිළිබඳ උපමාව (පිටුව 52)
ii. නැතිවූ කාසිය පිළිබඳ උපමාව (පිටුව 53)
iii. සමගි සන්ධානය (පිටුව 56 - 59)
iv. රෝගීන් ආලේපනය (පිටුව 61 - 69)